## III කොටස - පහතරට නර්තනය

**31.** තෙල්මෙ ඇඳුම් කට්ටලයේ ගෙලට සහ පපු ප්‍රදේශයට භාවිත රංග වස්ත්‍රාභරණ වන්නේ,
(1) කරතැල්ල සහ පුන නූලයි. (2) කරපටිය සහ තෙල්මේ හැට්ටයයි.
(3) මාලය සහ තෙල්මේ හැට්ටයයි. (4) කරමාලය සහ පපු තැල්ලයි.

**32.** දෙවොල් මඩු ශාන්තිකර්මයේ ඉදිරිපත් කෙරෙන ඒකල නර්තනයකි,
(1) වාහල. (2) දෙවොල්.
(3) යහන් දැක්ම. (4) තෙල්මෙ.

**33.** "අතත ගණයට අයත් භාණ්ඩයක් වන මෙහි බෙර ඇස සඳහා බොකු හම් භාවිත වේ." මෙම පාඨයෙන් කියැවෙන්නේ කිනම් බෙරය ගැන ද?
(1) දෙවොල් බෙරය (2) ගැට බෙරය
(3) තම්මැට්ටම (4) දවුල

**34.** දෙවොල් මඩු ශාන්තිකර්මයට අයත් ප්‍රධාන සැරසිලි සඳහා භාවිත පාරිභාෂික යෙදුම් වන්නේ,
(1) අයිලය සහ යහනයි. (2) යහන සහ දෙවොල් තොරණයි.
(3) පත්තිනි තොරණ සහ දෙවොල් තොරණයි. (4) දෙවොල් තොරණ සහ අයිලයි.

**35.** "තක දිත් තක දොම් දොම් දිමි තක දොම් " යන බෙර පදය ප්‍රස්තාරගත කිරීමට සුදුසු තාල රූප වන්නේ,
(1) මාත්‍රා 2 තනි තිත ය. (2) මාත්‍රා 3 තනි තිත ය.
(3) මාත්‍රා 4 තනි තිත ය. (4) මාත්‍රා 3 + 4 දෙතිත ය.

**36.** සුබ නැකතින් කිරි ගසක අත්තක් කපා ගෙනැවිත් යාතිකා කොට පවත්වනු ලබන චාරිත්‍රය හඳුන්වනු ලබන්නේ,
(1) කප් සිටුවීම නමිනි. (2) බිසෝකප සිටුවීම නමිනි.
(3) කාලපන්දම්ගස සිටුවීම නමිනි. (4) කිරිගස සිටුවීම නමිනි.

**37.** පහත සඳහන් ඉරට්ටියෙහි හිස්තැන් සඳහා සුදුසු පද කොටස් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
"ගුංදත් ............ ගත ගත ............ "
(1) රිමිගත ගදිගත, දිගතම් (2) රෙගත ගදිරිකිට, ගහිතිගතම්
(3) ගුහිතිගදිරිකිට, දිගතම් (4) ගුහිතිගදිරිකිට, ගහිතිගතම්

**38.** දෙවොල් මඩුවේ චාරිත්‍ර විධියක් සහ නර්තන අංගයක් වන්නේ පිළිවෙළින්,
(1) කප් සිටු වීම සහ මිල්ල කැපීම ය. (2) කප් සිටුවීම සහ යහන් දැක්ම ය.
(3) තොරන් යාගය සහ වාහල නැටීම ය. (4) දෙවොල් සහ තෙල්මේ ය.

**39.** මාත්‍රා 2 න් 2 ට ආඝාත තැබිය හැකි තාල රූපයක් භාවිත නර්තන අංගය කුමක් ද?
(1) ශුද්ධ තාලය (2) ගුඳගතිගත වට්ටම
(3) කොණ්ඩනාවිච්චි තාලය (4) භාවාදී තාලය

**40.** දෙතිතේ තාල රූපයකට වාදනය කළ හැකි පහතරට නර්තන සම්ප්‍රදායේ බෙර පදය තෝරන්න.
(1) රෙඟුද ගතකු දොම් (2) ගුංද දෙගත ගදි ගත ගුඳ
(3) රුඟකිට තත් දොම් (4) දොම් තම්ගත ගදිතම් ගත

[හයවැනි පිටුව බලන්න.

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

## IV කොටස - සබරගමු නර්තනය

**31.** පබළු ඇඳුම් කට්ටලයේ හිසට සහ පපු ප්‍රදේශයට භාවිත රංග වස්ත්‍රාභරණ වන්නේ,
(1) නෙත්ති මාලය සහ අවුල්හැරයයි. (2) නෙත්ති මාලය සහ පබළු හැට්ටයයි.
(3) හිස් පලඳනාව සහ අවුල්හැරයයි. (4) හිස් පලඳනාව සහ පබළු හැට්ටයයි.

**32.** පහන් මඩුව ශාන්තිකර්මයේ ඉදිරිපත් කෙරෙන ඒකල නර්තනයකි,
(1) දලුමුර පාලිය. (2) යහන් දැක්ම.
(3) තෙල්මෙ. (4) දෙවොල්.

**33.** විතතාතත ගණයට අයත් භාණ්ඩයක් වන මෙහි බෙර ඇස් සඳහා හරක් හම් හෝ එළු හම් හෝ භාවිත වේ.
(1) දවුල (2) තම්මැට්ටම
(3) ගැට බෙරය (4) දෙවොල් බෙරය

**34.** පහන් මඩුව ශාන්තිකර්මයට අයත් ප්‍රධාන සැරසිලි සඳහා භාවිත පාරිභාෂික යෙදුම් වන්නේ,
(1) අයිලය සහ යහනයි. (2) දෙවොල් තොරණ සහ යහනයි.
(3) පත්තිනි තොරණ සහ කාල පන්දම්ගසයි. (4) පත්තිරිප්පුව සහ අයිලයයි.

**35.** "කුදත් තක්කිට තකට ජිමිතකු" යන බෙර පදය ප්‍රස්තාරගත කිරීමට සුදුසු තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 2 තනි තිත ය. (2) මාත්‍රා 2 + 3 දෙතිත ය.
(3) මාත්‍රා 3 + 4 දෙතිත ය. (4) මාත්‍රා 2 + 4 දෙතිත ය.

**36.** සුබ නැකතකින් කිරි ගසක අත්තක් කපා ගෙනැවිත් යාතිකා කොට පවත්වනු ලබන චාරිත්‍රය හඳුන්වනු ලබන්නේ,
(1) කප් සිටුවීම නමිනි. (2) බිසෝකප සිටුවීම නමිනි.
(3) කාලපන්දම්ගස සිටුවීම නමිනි. (4) කිරි ගස සිටුවීම නමිනි.

**37.** පහත සඳහන් අඩව්වෙහි හිස්තැන් සඳහා සුදුසු පද කොටස් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
"තත්කිට හර් .......... තත් කිත්තත් .......... "
(1) ජික්කිට හර්, ජිත් කිත්තත් (2) ජිත්කිත්තත්, ජික්කිට හර්
(3) ගතකිත්තත්, ජිත්කිටකුං (4) ජිත්කිටකුං, ගතකිත්තත්

**38.** පහන් මඩුවේ චාරිත්‍ර විධියක් සහ නර්තනාංගයක් වන්නේ පිළිවෙළින්,
(1) කප් සිටුවීම සහ මිල්ල කැපීම ය. (2) කප් සිටුවීම සහ යහන් දැක්ම ය.
(3) අඹ විදමන සහ රාමා මැරීම ය. (4) දෙවොල් නැටීම සහ පොත්කඩේ පාළිය ය.

**39.** මාත්‍රා 3 න් 3 ට ආඝාත තැබිය හැකි තාල රූපයක් භාවිත නර්තන අංගය කුමක්ද?
(1) පට්ටුතල් මාත්‍රය (2) ගමන් මාත්‍රය
(3) විරාඩි වන්නම (4) මණ්ඩුක වන්නම

**40.** දෙතිතේ තාල රූපයට වාදනය කළ හැකි බෙර පදය තෝරන්න.
(1) ජිමිතකු දා දොම් (2) ජිං කිටිතක් තක් කිටිතක
(3) ජිංත ජිමිත්තක් තක්කිට තරිකිට (4) කුදත් තක්කිට තකට ජිමිතකු

* *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
[හත්වැනි පිටුව බලන්න.
[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

